[භගවා:]

තථාගතස්ස බුද්ධස්ස සබ්බඤ්ඤුතානුකම්පිනො,
තස්සච්චයා න විජ්ජන්ති තස්ස නත්ථි අපාගතං,
සො න සම්මොහමාපාදි සොව[1] ධීරො සදා සතො.

අච්චයං දෙසයන්තීනං යො වෙ න පටිගණ්හති,
කොපන්තරො දොසගරු ස වෙරං[2] පටිමුඤ්චති,
තං වෙරං නාභිනන්දාමි පතිගණ්හාමි වොච්චයන්ති.

1. 4. 6.

සද්ධාසුත්තං.

36. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති ජේතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. අථ ඛො සම්බහුලා **සතුල්ලපකායිකා** දෙවතායො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

සද්ධා දුතියා පුරිසස්ස හොති නො චෙ අස්සද්ධියං අවතිට්ඨති
යසො ච කිත්ති ච තත්වස්ස හොති.
සග්ගඤ්ච සො ගච්ඡති සරීරං පහායාති.[3]

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං සංයොජනං සබ්බමතික්කමෙය්‍ය,
තං නාමරූපස්මිමසජ්ජමානං අකිඤ්චනං නානුපතන්ති සඞ්ගාති.

පමාදමනුයුඤ්ජන්ති බාලා දුම්මෙධිනො ජනා
අප්පමාදඤ්ච මෙධාවී ධනං සෙට්ඨං'ව[4] රක්ඛති

මා පමාදමනුයුඤ්ජෙථ මා කාමරතිසන්ථවං
අප්පමත්තො හි ඣායන්තො පප්පොති පරමං සුඛන්ති.

1. 4. 7.

සමයසුත්තං.

37. එවං මෙ සුතං: එකං සමයං භගවා **සක්කෙසු** විහරති **කපිලවත්ථුස්මිං** මහාවනෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි. දසහි ච ලොකධාතූහි දෙවතා යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති භගවන්තං දස්සනාය භික්ඛුසඞ්ඝඤ්ච.

1. සො ච – PTS සොධ – සහා, සිමු. 1. 2. යං වෙරං – සිමු. 1. PTS 3. විහාය – මජසං
4. ශ්‍රෙෂ්ඨීව' යි සංස්කෘත ධම්මපදපාඨ'යි.

Free Distribution www.aathaapi.org

[භගවත්හු:]

චතුස්සත්‍යය අවබෝධ කළා වූ හැම සතුන් කෙරෙහි අනුකම්පා ඇති ඒ තථාගතයන් වහන්සේගේ වැරදි නැත. උන්වහන්සේගේ අපරාධ නැත. උන්වහන්සේ මුළාවට නො පැමිණෙත්. මේ ලෝකයෙහි උන්වහන්සේ ම හැම කල්හි සිහි ඇති සේක. පණ්ඩිත සේක.

ඉදින් යමෙක් දෙසන්නවුන්ගේ වරද නො පිළිගණී ද, ඇතුළත කෝප ඇති ද්වේෂය ගුරු කොට ගෙණ වසන හෙතෙමේ වෛරය (තමා කෙරෙහි) බැඳ තබයි. ඒ වෛරය නො පිළිගණිමි. තොපගේ වරද පිළිගණිමි යි.

1. 4. 6.

සද්ධා සූත්‍රය.

36. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬුසිටුහුගේ අරමෙහි වැඩවසන සේක. එකල්හි විශිෂ්ට ඡවිවණ් ඇති බොහෝ වූ සතුල්ලපකායික දේවතාවෝ රෑ පෙරයම ඉක්ම ගියකල්හි මුළු දෙව්රම බබුළුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ.

එකත්පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

පුරුෂයාට ශ්‍රද්ධාව දෙවැනි වේ. ඉදින් සැදැහැ නැති බව නො සිටී නම්, ඒ හේතුවෙන් ඔහුට පිරිවර ද කීර්තිය ද වෙයි. හෙතෙමේ සිරුර හැර පියා ස්වර්ගයට ද යෙයි.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කී ය:

ක්‍රෝධය දුර ලන්නේ ය. මානය වෙසෙසින් බැහැර ලන්නේ ය. සියලු සංයෝජන ඉක්මවන්නේ ය. නාමරූප දෙක්හි නොඇලෙන කෙලෙස් පළිබෝධ රහිත වූ ඔහු මත සඞ්ගයෝ නො වැටෙත්.

බාල වූ නුවණ නැත්තා වූ ජනයෝ ප්‍රමාදයෙහි යෙදෙත්. නුවණැත්තේ අප්‍රමාදය ශ්‍රෙෂ්ඨ[1] ධනය මෙන් රකී.

ප්‍රමාදයෙහි තගමක් යෙදෙන්නේ ය. කාමරතියෙහි යෙදීම නො කරන්නේ ය. අප්‍රමත්ත පුද්ගල තෙමේ වනාහි ධ්‍යාන කරන්නේ උතුම් සුවයට පැමිණෙයි.

1. 4. 7.

සමය සූත්‍රය.

37. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය දනව්වෙහි කිඹුල්වත්පුර සමීපයෙහි වූ මහාවනයෙහි හැම ම රහත් වූ භික්ෂූන් පන්සියක් පමණ වූ මහභික්සඟන සමග වැඩ වසන සේක. දසදහසක් සක්වළින් දේවතාවෝ භාග්‍යවතුන් වහන්සේත් භික්ෂු-සඞ්ඝයාත් දකිනු පිණිස බෙහෙවින් රැස් වූවාහු ද වෙත්.

1. 'ශ්‍රෙෂ්ඨව' යන්න 'සෙට්ඨිව' යි ගත හොත් 'සිටුවරයා' යි අර්ථ කිය යුතු ය.